// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1955/23 - 2016 පෙබරවාරි මස 25 වැනි බ්‍රහස්පතින්දා - 2016.02.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### වන්දනා ගමන් ආඥාපනත

ස්වදේශ කටයුතු අමාත්‍යවරයා විසින් (175 වැනි අධිකාරය වූ) වන්දනා ගමන් ආඥාපනතේ 2 වැනි වගන්තිය යටතේ සාදනු ලබන නියෝග.

වජිර අබේවර්ධන,
ස්වදේශ කටයුතු අමාත්‍ය.

2016 පෙබරවාරි මස 15 වැනි දින,
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

නියෝග

1. මේ නියෝග ''මහගල්ගමුව ශුද්ධවූ ජුසේවාස් මුනිඳුන්ගේ සිද්ධස්ථානය (වාර්ෂික උත්සවය) නියෝග'' යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මේ නියෝගවල -
''කඳවුරු පෙදෙස'' යන්නෙන් මෙහි උපලේඛනයෙහි විස්තර කරනු ලැබ ඇති ප්‍රදේශ අදහස් වේ.
''දිසාපතිවරයා'' යන්නෙන් කුරුණෑගල පරිපාලන දිස්ත්‍රික්කයේ දිසාපතිවරයා අදහස් වන අතර, ඔහු විසින් 4 වැනි නියෝගය යටතේ බලය පවරනු ලැබූ යම් නිලධාරියෙක් ද ඊට ඇතුළත් වේ.
''වෛද්‍ය නිලධරයා'' යන්නෙන් කඳවුරු පෙදෙස භාර සෞඛ්‍ය වෛද්‍ය නිලධරයා අදහස් වේ.
''වන්දනාකරු'' යන්නෙන් කඳවුරු පෙදෙසට ඇතුළත් වී කවර හෝ කාර්යයක් සඳහා කඳවුරු පෙදෙස තුළ නතර වී සිටින යම් තැනැත්තෙක් අදහස් වේ.
''පොලිස් නිලධරයා'' යන්නෙන් කඳවුරු පෙදෙස භාර යම් ග්‍රාමසේවා නිලධරයෙක් ද අදහස් වේ.
''මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා'' යන්නෙන් කඳවුරු පෙදෙස භාර මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා අදහස් වේ.

3. මේ නියෝග කුරුණෑගල පරිපාලන දිස්ත්‍රික්කයේ මහගල්ගමුව ශුද්ධවූ ජුසේවාස් මුනිඳුන්ගේ සිද්ධස්ථානයේ උත්සවය සඳහා කෙරෙන වන්දනා ගමන් සම්බන්ධයෙන් අදාළ වන්නේ ය.

4. මේ නියෝග යටතේ දිස්ත්‍රික් ලේකම්/දිසාපති වෙත පැවරී ඇති යම් බලයක් ක්‍රියාත්මක කිරීම සඳහා සහ නියම වී ඇති යම් කාර්යයක් ඉටු කිරීම සඳහා යම් රජයේ නිලධාරියෙකු වෙත ලිඛිතව බලය පැවරීමට දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාට බලය ඇත්තේ ය.

1A - G 23074 — 08 (2016/02)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

5. (1) කඳවුරු පෙදෙස තුළට හෝ කඳවුරු පෙදෙසින් පිටතින් හෝ කඳවුරු පෙදෙස ඇතුළත හෝ වාහන ගමනාගමනය හෝ පයින් ගමන් කිරීම විධිමත් කිරීමට දිසාපතිවරයාට බලය ඇත්තේ ය.

(2) මේ නියෝගය (1) වැනි ඡේදය යටතේ තමා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමෙහිලා දිසාපතිවරයා විසින් යම් පොලිස් නිලධරයෙකු දෙන ලද උපදෙස්වලට අනුකූලව එම පොලිස් නිලධරයා විසින් කරනු ලබන යම් නීත්‍යානුකූල නියමයකට පටහැනිව කිසිම තැනැත්තකු විසින් ක්‍රියා නොකරනු ලැබිය යුතු ය.

6. දිසාපතිවරයාගේ ලිඛිත අවසරය නොමැතිව කිසිම තැනැත්තෙකු විසින් කිසිම ගවයකු හෝ වෙනත් යම් සතෙකු හෝ කඳවුරු පෙදෙස තුළට ගෙන ඒම නොකළ යුතු ය.

එසේ වුව ද, 7 වැනි නියෝගය යටතේ කරත්ත හා ගොනුන් නවත්වා තැබීම සඳහා වෙන් කරනු ලැබ ඇති ස්ථානයක් කරා, කරත්ත ගෙන යාම හෝ ගොනුන් දක්කාගෙන යැම හෝ සම්බන්ධයෙන් මේ නියෝගය අදාළ නොවන්නේ ය.

7. (1) කඳවුරු පෙදෙස ඇතුළත පහත ස්ථාන වෙන් කර තැබීමට හෝ සැපයීමට දිසාපතිවරයාට බලය ඇත්තේ ය.

(අ) බස්රථ හා වෙනත් මෝටර් වාහන නවත්වා තබන ස්ථාන ;

(ආ) කරත්ත හා ගොනුන් නවත්වා තබන ස්ථාන ;

(ඇ) එක් එක් වන්දනා නඩයට නවාතැන් ගැනීම පිණිස වෙන වෙනම ස්ථාන ;

(ඈ) අසනීපවන වන්දනාකරුවන්ට නතර වීම පිණිස ස්ථාන ;

(ඉ) සිගමන් යැදීමට සහ පිනට ඉල්ලා ගැනීම සඳහා වූ ස්ථාන ;

(ඊ) විකිණීම සඳහා යම් ද්‍රව්‍ය ප්‍රදර්ශනය කර තබන ස්ථාන ;

(උ) විවිධ කාර්ය සඳහා මඩු ඉදි කිරීමට හැකි ස්ථාන ;

(ඌ) සේදීමේ කාර්යය සඳහා වන්දනාකරුවන්ගේ ප්‍රයෝජනය පිණිස වූ වැව්, ළිං, දිය වළවල් හා, සහ එවැනි පහසුකම් සලසන වෙනත් ස්ථාන ;

(එ) ස්නානය සඳහා වන්දනා කරුවන්ගේ ප්‍රයෝජනය පිණිස වැව්, ළිං, දියවලවල් සහ එවැනි පහසුකම් සලසන වෙනත් ස්ථාන ;

(ඒ) බීමට ජලය ලබා ගැනීම සඳහා වන්දනාකරුවන්ගේ ප්‍රයෝජනය පිණිස වැව්, ළිං, දියවලවල් සහ එවැනි පහසුකම් සලසන වෙනත් ස්ථාන ;

(ඔ) අවශ්‍ය යැයි දිසාපතිවරයා සළකන වෙනත් කාර්යයන් සඳහා වූ ස්ථාන.

(2) අවශ්‍ය යැයි දිසාපතිවරයා විසින් සලකනු ලැබුවහොත් ඔහු විසින් (1) වැනි ඡේදයේ දැක්වෙන යම් කාර්යයක් සඳහා යම් ස්ථානයක් ඒ ස්ථානයේ දැන්වීමක් හෝ නාම පුවරුවක් හෝ ප්‍රදර්ශනය කිරීමෙන් වෙන් කළ හැකිය.

(3) දිසාපතිවරයා විසින් (1) වැනි ඡේදය යටතේ යම් කාර්යයක් සඳහා යම් ස්ථානයක් වෙන් කර ලැබ හෝ සපයනු ලැබ ඇති අවස්ථාවක දී ඒ ස්ථානය හුදෙක් එම කාර්යය සඳහා පමණක්ම පාවිච්චි කරනු ලැබිය යුතු අතර කඳවුරු පෙදෙස ඇතුළත වෙනත් කිසිම ස්ථානයක් එම කාර්යය සඳහා කිසිම තැනැත්තෙකු විසින් පාවිච්චි නොකරනු ලැබිය යුතු ය.

8. රෝග වළක්වා ගැනීම සඳහා කඳවුරු පෙදෙස තුළ යම් වැවකට, ළිඳකට, දිය වළකට හෝ ජලාශයකට ක්ලෝරීන් යෙදීම, යම් වැවක්, ළිඳක්, දිය වළක් හෝ ජලාශයක් වසා දැමීම හෝ අවශ්‍ය යැයි දිසාපතිවරයා හෝ වෛද්‍ය නිලධාරියා හෝ අදහස් කළහොත් එසේ කිරීමට ඒ දිසාපතිවරයාට, වෛද්‍ය නිලධාරියාට බලය ඇත්තේ ය.

9. (1) දිසාපතිවරයා විසින් තත් කාර්යය සඳහා නිකුත් කරන ලද අවසර පත්‍රයක බලය මත සහ එවැනි අවසර පත්‍රයක සඳහන් කොන්දේසිවලට අනුකූලව මිස, කිසිම තැනැත්තෙකු විසින් 7 වැනි නියෝගය යටතේ යම් කාර්යයක් සඳහා වෙන් කරනු ලැබ තිබෙන හෝ සපයනු ලැබ තිබෙන ස්ථානයක් ද ඇතුළුව කඳවුරු පෙදෙස තුළ කිසිම ස්ථානයක කවර හෝ කවර කාර්යයක් සඳහා යම් මඩුවක් හෝ යම් තාවකාලික හෝ ස්ථිර ගොඩනැගිල්ලක් හෝ වෙනත් යම් ඉදිකිරීමක්, තැනීමක් හෝ දැනට පවත්නා යම් ගොඩනැගිල්ලකට හෝ වෙනත් ඉදිකිරීමකට අලුතින් කොටසක් එකතු කිරීම හෝ නොකරනු ලැබිය යුතු ය.

(2) යම් තැනැත්තෙකු විසින් මේ නියෝගයේ (1) වැනි ඡේදයට පටහැනි වන පරිදි යම් මඩුවක් හෝ යම් තාවකාලික හෝ ස්ථිර ගොඩනැගිල්ලක් හෝ වෙනත් යම් ඉදිකිරීමක් තනනු ලැබුවහොත් දැනට පවත්නා යම් ගොඩනැගිල්ලකට හෝ ඉදිකිරීමකට අළුතින් කොටසක් ඉදි කරනු ලැබුවහොත් ඒ තැනැත්තා වෙත ලිඛිත දැන්වීමක් භාර දීමෙන් පසු එම දැන්වීමේ සඳහන් කරන කාල සීමාව ඇතුළත අවස්ථාවෝචිත පරිදි එම මඩුව හෝ ගොඩනැගිල්ල හෝ ඉදිකිරීම හෝ දැනට පවත්නා ගොඩනැගිල්ලකට හෝ ඉදිකිරීමකට අලුතින් එකතු කරන ලද කොටස ඉවත් කරන ලෙස හෝ කඩා දමන ලෙස දිසාපතිවරයා විසින් එම තැනැත්තාට නියම කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

(3) මෙම නියෝගයේ (2) ඡේදය යටතේ දැන්වීමක් භාර දෙනු ලැබූ යම් තැනැත්තෙකු විසින් එහි සඳහන් කාල සීමාව තුළ ඒ දැන්වීමේ නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරිනු ලැබූ අවස්ථාවක හෝ ඒ දැන්වීම භාර දෙනු ලැබිය යුතු නියම තැනැත්තා කවරෙක් ද යන්න පිළිබඳව සැකයක් උද්ගතවන අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, ඒ මඩුව, ගොඩනැගිල්ල, ඉදිකිරීම හෝ දැනට පවත්නා යම් ගොඩනැගිල්ලකට හෝ ඉදිකිරීමකට අලුතින් එකතු කරන ලද කොටස ඉවත් කිරීමට හෝ කඩා දැමීමට දිසාපතිවරයා විසින් සලස්වනු ලැබීම නිත්‍යානුකූල වන අතර එකී ඉවත් කිරීම හෝ කඩා දැමීම සඳහා අවශ්‍ය වන කම්කරුවන්, උපකරණ සහ යන්ත්‍රෝපකරණ සහිතව දිසාපතිවරයා යම් ඉඩමකට හෝ යම් භූමියකට ඇතුලත් වීම ද එය ඉවත් කිරීම හෝ කඩා දැමීම සඳහා අවශ්‍ය වන සියලු දේ කිරීම හෝ එසේ කිරීමට දිසාපතිවරයා විසින් සලස්වනු ලැබීම ද නීත්‍යානුකූල වන්නේ ය.

10. යම් වැසිකිළියක හෝ වැසිකිළියක් අසල දැන්වීමක් හෝ සංඥා පුවරුවක් ප්‍රදර්ශනය කිරීමෙන් දිසාපතිවරයා විසින් වන්දනාකරුවන්ගේ ප්‍රයෝජනය සඳහා වෙන් කරන ලද වැසිකිළියක හැර කිසිම තැනැත්තෙකු විසින් කඳවුරු පෙදෙස තුළ මලමුත්‍රා පහ කිරීම නොකරනු ලැබිය යුතු ය.

11. කඳවුරු පෙදෙස තුළ යම් වැවක, ළිඳක, දිය වළක, ජලාශයක, ඇළක දොළක හෝ දිය පාරක ඇති ජලය කිසිම තැනැත්තෙකු විසින් අපිරිසිදු නොකරනු ලැබිය යුතු ය.

12. කැළිකසළ දැමීම සඳහා දිසාපතිවරයා විසින් සපයනු ලැබ ඇති ස්ථානයකට හෝ භාජනයකට මිස කිසිම තැනැත්තෙකු විසින් කඳවුරු පෙදෙස තුළ ද්‍රවමය හෝ ද්‍රවමය කැළිකසළ දැමීම නොකරනු ලැබිය යුතු ය.

13. (1) කඳවුරු පෙදෙස තුළ වන්දනාකරුවන්ට සියලු ආහාර පාන බෙදා හැරීම විධිමත් කිරීමේ බලය දිසාපතිවරයාට ඇත්තේ ය.

(2) තමා වෙත මේ නියෝගයේ (1) වැනි ඡේදය යටතේ පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමෙහිලා දිසාපතිවරයා විසින් දෙන ලද උපදෙස්වලට අනුකූලව යම් පොලිස් නිලධරයෙකු විසින් හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා විසින් හෝ දෙනු ලබන යම් නීත්‍යානුකූල නියමයකට කිසිම තැනැත්තෙකු අකීකරු නොවිය යුතු ය.

14. (1) කඳවුරු පෙදෙස තුළ විකිණීම සඳහා හෝ වෙනත් කාර්යක් සඳහා ප්‍රදර්ශනය කරනු ලැබ ඇති හෝ තබා ඇති යම් ආහාරයක් හෝ පානයක් අපවිත්‍ර වී ඇති බව හෝ මනුෂ්‍ය පරිභෝජනය සඳහා නුසුදුසු වී ඇති බව හැඟී ගිය අවස්ථාවක දිසාපතිවරයා විසින්, වෛද්‍ය නිලධාරියා විසින් හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා විසින් හෝ ඒ ආහාරය හෝ පානය පරිභෝජනයට නුසුදුසු බවට ප්‍රකාශ කරනු ලැබිය හැකි ය.

(2) මේ නියෝගයේ (1) වැනි ඡේදය යටතේ පරිභෝජනයට නුසුදුසු බවට ප්‍රකාශ කරන ලද ආහාරයක් හෝ පානයක් කිසිම තැනැත්තෙකු විසින් කඳවුරු පෙදෙස තුළ විකිණීම නොකරනු ලැබිය යුතු ය.

(3) මෙම නියෝගයේ (1) වැනි ඡේදය යටතේ පාවිච්චියට නුසුදුසු බවට ප්‍රකාශ කරන ලද යම් ආහාරයක් හෝ පානයක් යම් පොලිස් නිලධාරියෙකු විසින් හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයෙකු විසින් තහනමට ගෙන විනාශ කර දමනු ලැබීම නීත්‍යානුකූල වන්නේ ය.

15. බේකරියක්, කැවිලි හලක්, හෝ කැවිලි සාදන ස්ථානයක්, භෝජනාගාරයක් හෝ දන්සැලක් පවත්වාගෙන යාම සඳහා දිසාපතිවරයා විසින් නිකුත් කරන ලද බලපත්‍රයක බලය මත සහ ඒ බලපත්‍රයේ සඳහන් කොන්දේසිවලට අනුකූලව මිස කිසිම තැනැත්තෙකු විසින් 7 වැනි නියෝගය යටතේ යම් කාර්යයක් සඳහා වෙන් කරනු ලැබ තිබෙන සේවා සපයනු ලැබ තිබෙන ස්ථානයක් ද ඇතුළුව කඳවුරු පෙදෙස තුළ කිසිම ස්ථානයක එවැනි බේකරියක් හෝ කැවිලි හලක් හෝ කැවිලි සාදන ස්ථානයක් හෝ භෝජනාගාරයක් හෝ දන්සැලක් පිහිටුවීම හෝ පවත්වාගෙන යාම නොකරනු ලැබිය යුතු ය. සෑම බලපත්‍රයක්ම වෛද්‍ය නිලධරියාගේ හෝ වෛද්‍ය නිලධරියා විසින් බලය දෙනු ලැබූ කිසියම් තැනැත්තෙකු හෝ නිර්දේශය මත ගාස්තුවකින් තොරව නිකුත් කරනු ලැබිය යුතු ය.

16. කඳවුරු පෙදෙස තුළ ඇති සියලුම බේකරි, කැවිලි හලක් හෝ කැවිලි සාදන ස්ථානයක්, භෝජනාගාරයක් සහ දන්සැලක් සහ ඒවායේ ඇති සියලු ගෘහ භාණ්ඩ සහ උපකරණ පිරිසිදු සහ සනීපාරක්ෂාවට හිතකර තත්ත්වයකින් තබා ගත යුතු ය.

17. කඳවුරු පෙදෙස ඇතුළත විකිණීම සඳහා හෝ වෙනත් කාර්යයන් සඳහා හෝ ප්‍රදර්ශනය කරනු ලැබ ඇති හෝ තබා ඇති සියලු කේක් වර්ග, රස කැවිලි සහ පිසින ලද ආහාර වෛද්‍ය නිලධාරියා හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා හෝ සෑහීමකට පත්වන පරිදි මැස්සන්ට ඇතුල්විය නොහැකි පරිදි නිසි ලෙස තනන ලද වීදුරු ආවරණය තුළ තැබීම කරනු ලැබිය යුතු ය.

18. තේ අපද්‍රව්‍ය, කිරි අපද්‍රව්‍ය හෝ යම් ආහාර හෝ පානයක ඉතිරි වූ කොටස් හෝ පිසීමේ දී ඉවතලන ද්‍රව්‍ය හෝ වෙනත් ඉවතලන ද්‍රව්‍ය කිසිවක් කඳවුරු පෙදෙස තුළ කිසිම ස්ථානයක බිමට විසිකරනු නොලැබිය යුතුය. එවැනි සියලු අපද්‍රව්‍ය ඉතිරි වූ කොටස්

හෝ ඉවතලන ද්‍රව්‍ය 19 වැනි නියෝගයෙහි විධිවිධාන සලසා ඇති ආකාරයට තබා ඇති භාජනයකට දැමිය යුතු ය. එසේම අපද්‍රව්‍ය, ඉතිරි වූ කිරි කොටස් හෝ ඉවතලන ද්‍රව්‍ය කිසිවක් කඳවුරු පෙදෙස ඇතුළත යම් ස්ථානයක බිමෙහි හෝ ඒ අසළ පොළවේ විසිකොට තිබෙන බව පෙනී ගියහොත් ඒ ස්ථානයෙහි අයිතිකරු විසින් හෝ ප්‍රධාන පදිංචිකරු විසින් හෝ ඒ ස්ථානය බේකරියක්, කැවිලි හලක්, කැවිලි සාදන ස්ථානයක්, භෝජනාගාරයක් හෝ දන්සැලක් වන අවස්ථාවක ඒ ස්ථානයේ බලපත්‍රධාරියා විසින් මෙම වරද සිදුවීම වැළැක්වීමට අවශ්‍ය සියලුම පූර්වෝපාය යෙදූ බව සහ නිසි සැලකිල්ලෙන් ක්‍රියා කළ බව ඔප්පු කරනු ලැබුවහොත් හැර එකී අයිතිකරු හෝ ප්‍රධාන පදිංචිකරු හෝ එකී බලධාරියා මේ නියෝගයේ විධිවිධාන කඩකර ඇති ලෙස සලකනු ලබන්නේ ය.

19. කඳවුරු පෙදෙස තුළ පිහිටි සියලු බේකරි, කැවිලිහල්, කැවිලි සාදන ස්ථාන, භෝජනාගාර, දන්සැල් සහ වෙළඳසැල් හෝ ව්‍යාපාරික කාර්යයක් සඳහා පාවිච්චි කරනු ලබන ගොඩනැගිලි හෝ ඉදිකිරීම් සඳහා ඝන මීටර් 1 1/2කට (ඝන අඩි 4 1/2 ට) නොඅඩු ධාරිතාවක් ඇති දැවමය හෝ ලෝහමය කසළ බඳුනක් සපයනු ලැබිය යුතු අතර, එකී කසළ බඳුන එහි කසළ තැන්පත් කරනු ලබන විට හෝ ඉන් කසළ ඉවත් කරනු ලබන විට හැර වෙනත් සෑම අවස්ථාවකදීම, දැවමය හෝ ලෝහමය පියනකින් වසා තැබිය යුතු ය.

20. (1) දිසාපතිවරයාගේ මතය අනුව මෙම නියෝගවල 15, 16, 17, 18 හෝ 19 වැනි නියෝග කඩකරමින් පිහිටුවනු ලැබ ඇත්තා වූ හෝ පවත්වාගෙන යනු ලබන්නා වූ ද, කඳවුරු ප්‍රදේශ තුල පිහිටියා වූ ද යම් බේකරියක්, කැවිලි හලක් හෝ කැවිලි සාදන ස්ථානයක්, භෝජනාගාරයක්, දන්සැලක් හෝ යම් වෙළඳ ව්‍යාපාරික ස්ථානයක් වසා දැමීමට නියම කිරීමේ හා ඒ ස්ථානය වෙනුවෙන් යම් බලපත්‍රයක් නිකුත් කරනු ලැබ තිබේ නම්, එකී බලපත්‍රය වහාම අවලංගු කිරීමේ බලය දිසාපතිවරයාට ඇත්තේ ය.

(2) යම් බේකරියක්, කැවිලි හලක් හෝ කැවිලි සාදන ස්ථානයක් හෝ භෝජනාගාරයක්, හෝ දන්සැලක් හෝ යම් වෙළඳ ව්‍යාපාරික ස්ථානයක් භාරව සිටින යම් තැනැත්තෙකු විසින් මේ වගන්තියේ (1) වැනි ඡේදය යටතේ දිසාපතිවරයාගේ යම් නිත්‍යානුකූල නියමයක් අනුව ක්‍රියා කළ යුතු ය.

21. යම් ආසාදන රෝගයකින් හෝ ස්පර්ශක රෝගයකින් පෙළෙන කිසිම තැනැත්තෙක් කඳවුරු පෙදෙස තුළට ඇතුල් නොවිය යුතු ය.

22. (1) කඳවුරු පෙදෙස තුළ යම් වසංගත රෝගයක් පැතිරී යන විටක දිසාපතිවරයා විසින් වන්දනාකරුවන්ට කඳවුරු භූමියෙන් වහාම පිටවන ලෙස නියම කරනු ලැබීම ද, ඉවත්ව යායුතු ගමන් මාර්ගය සහ ඉවත්ව යාමේ දී උපයෝගී කරගත යුතු ප්‍රවාහන ක්‍රමය හා පිළිවෙල දිසාපතිවරයා විසින් නියම කරනු ලැබීම ද නිත්‍යානුකූල වන්නේ ය.

(2) දිසාපතිවරයා විසින් මෙම වගන්තියේ (1) වන ඡේදය යටතේ දෙනු ලබන යම් නිත්‍යානුකූල නියමයකට පටහැනිව කිසිම තැනැත්තෙක් ක්‍රියා නොකළ යුතු ය.

23. කඳවුරු පෙදෙස තුළ යම් ආසාදන රෝගයක් හෝ ස්පර්ශක රෝගයක් වැළඳී ඇති සෑම තැනැත්තෙක්ම ද, යම් තැනැත්තෙකුට යම් ආසාදන රෝගයක් හෝ ස්පර්ශක රෝගයක් වැළඳී ඇති බව දැන දැනම ඒ තැනැත්තා සමග එකට වාසය කරන විටෙකත් සෑම තැනැත්තෙක්ම ද, ඒ බව වෛද්‍ය නිලධාරියාට හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයාට හෝ යම් පොලිස් නිලධාරියකුට හෝ වහාම වාර්තා කළ යුතු ය.

24. ආසාදන රෝගයකින් හෝ ස්පර්ශක රෝගයකින් පෙළෙන හෝ පෙළෙන්නේ යැයි තමා දන්නා කිසිම තැනැත්තෙකුට කඳවුරු පෙදෙස ඇතුළත යම් බේකරියක්, කැවිලි හලක් හෝ කැවිලි සාදන ස්ථානයක් හෝ භෝජනාගාරයක්, හෝ දන්සැලක් තත් කාලයේ භාරව සිටින යම් තැනැත්තෙකු විසින් අවස්ථාවෝචිත පරිදි ඒ බේකරියට, කැවිලිහලට හෝ කැවිලි සාදන ස්ථානයකට, භෝජනාගාරයට හෝ දන්සැලට ඇතුළුවීමට හෝ යම් ද්‍රව්‍යයක් හෝ ආහාරපාන හෝ බෙදා හැරීමේ දී, විකිණීමේ දී හෝ නිෂ්පාදනය කිරීමේ දී හෝ සහභාගි වීමට හෝ ඉඩ නොදෙනු ලැබිය යුතු ය.

25. යම් බේකරියක, කැවිලි හලක හෝ කැවිලි සාදන ස්ථානයක හෝ භෝජනාගාරයක, හෝ දන්සැලක බලපත්‍රධාරියෙකු විසින් හෝ යම් නවාතැන්පළක හෝ වන්දනාකරුවන්ගේ විශ්‍රාම ශාලාවක අයිතිකරු හෝ ප්‍රධාන පදිංචිකරු විසින් ආසාදන රෝගයකින් හෝ ස්පර්ශක රෝගයකින් පෙළෙන යම් තැනැත්තෙකුට අවස්ථාවෝචිත පරිදි ඒ බේකරියේ, කැවිලි හලේ හෝ කැවිලි සාදන ස්ථානයේ, භෝජනාගාරයේ හෝ දන්සැලේ, නවාතැන්පලේ හෝ වන්දනාකරුවන්ගේ විශ්‍රාම ශාලාවේදී කවර හෝ කාලසීමාවක් නැවතී සිටීමට ඉඩ නොදිය යුතු ය. එවැනි ස්ථානයක ආසාදන රෝගියකු හෝ ස්පර්ශක රෝගියකු සිටින බව අනාවරණය වූ අවස්ථාවක අවස්ථාවෝචිත පරිදි එහි බලපත්‍රධාරී විසින් හෝ අයිතිකරු හෝ ප්‍රධාන පදිංචිකරු විසින් හෝ එම කරුණ වහාම වෛද්‍ය නිලධාරියාට හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයාට හෝ යම් පොලිස් නිලධරයෙකුට වාර්තා කළ යුතු ය.

26. 7 වැනි නියෝගය යටතේ හිඟමන් යැදීම හෝ පිනට ඉල්ලා ගැනීම සඳහා වෙන් කරනු ලැබ ඇති හෝ සපයනු ලැබ ඇති ස්ථානයකදී හැර කඳවුරු පෙදෙස තුළ මුදලින්, යම් වෙනත් ආකාරයකින් හෝ කිසිම තැනැත්තෙකු විසින් පිනට දීම හෝ පිනට යමක් බෙදා හැරීම හෝ නොකළ යුතු ය.

27. දිසාපතිවරයාගේ ලිඛිත අවසරයක් නොමැති කිසිම තැනැත්තෙකු විසින් කඳවුරු පෙදෙස තුළ ගිනිකෙළි භාණ්ඩ හෝ ගිනි අවි කිසිවක් පත්තු කිරීම නොකළ යුතු ය.

28. 7 වැනි නියෝගය හෝ 10 වැනි නියෝගය යටතේ යම් ස්ථානයක ප්‍රදර්ශනය කරනු ලැබ ඇති යම් දැන්වීමක් හෝ නාම පුවරුවක් කිසිම තැනැත්තෙකු විසින් හෝ අයුතු ලෙස වෙනස් කිරීම හෝ ඉවත් කිරීම නොකළ යුතු ය.

29. දිසාපතිවරයා, වෛද්‍ය නිලධරයා හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා හෝ යම් පොලිස් නිලධරයෙකු විසින් -

(අ) මේ නියෝග අතුරෙන් යම් නියෝගයක් හෝ ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා කඳවුරු පෙදෙස තුළ ඇති යම් ඉඩමකට ස්ථානයකට හෝ ඇතුළු වීම ; සහ

(ආ) 7 වැනි නියෝගය යටතේ යම් දැන්වීමක් හෝ නාම පුවරුවක් ප්‍රදර්ශනය කර තැබීමේ කාර්යය සඳහා කඳවුරු පෙදෙස තුළ යම් ඉඩමක හෝ ස්ථානයක යම් කණුවක් සිටුවීම හෝ ඉදිකිරීමක් ගොඩනැගීම නීත්‍යානුකූල වන්නේ ය.

30. දිසාපතිවරයා විසින්,

(අ) 6 වැනි නියෝගය හෝ 27 වැනි නියෝගය යටතේ දෙන ලද යම් අවසරයක්,

(ආ) 9 වැනි නියෝගය යටතේ නිකුත් කරන ලද අවසර පත්‍රයක්,

(ඇ) 15 වැනි නියෝගය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් අවලංගු කිරීම යෝග්‍ය යැයි හෝ මහජන යහපත පිණිස වන්නේ යැයි දිසාපතිවරයාට පෙනී යන්නේ යැයි, ඔහු විසින් ඕනෑම හෝ වේලාවක එය එසේ අවලංගු කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

**උපලේඛනය**

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 60 මහගල්ගමුව ග්‍රාම නිලධාරි වසමේ ශුද්ධවූ ජුසේවාස් මුනිඳුන්ගේ සිද්ධස්ථානය පිහිටි භූමි භාගය.

ඊට මායිම් පහත දැක්වෙන පරිදි වේ.

*උතුරට* : උතුරට ඇල සහ මාර්ගය ;
*නැගෙනහිරට*: අ.ග.පි. 99 හි කැබලි අංක 195 ;
*දකුණට* : අ.ග.පි. 99 හි කැබලි අංක 181, 183, 184 ;
*බස්නාහිරට* : අ.ග.පි. 99 හි කැබලි අංක 181, 183, 184 සහ ඇල සහ මාර්ගය.

03 - 292

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.